<u>පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2023.02.24 වන දින පැවැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව.</u>

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ විශේෂ මහා සභා රැස්වීම 2023 පෙබරවාරි මස 24 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

02. ගරු උපසභාපති - ඩී.වී.උපාලි මැතිතුමා.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා.
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.වී.ආරියරත්න මැතිතුමා.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඒ.ඉන්දික මැතිතුමා.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.පියසේන මැතිතුමා.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - වයි.ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සෙල්වනායගම් රගවන් මැතිතුමා.
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය.
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය.
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා.
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා.
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා.
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය.

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**<u>I . ගරු සභාපති ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.</u>**

1. 2022 වර්ෂයට අදාළව සකස් කරන ලද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශය හා එයට අදාළ කාර්ය සාධන වාර්තාව අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසා සිටියේ සෑම මාසික සභා රැස්වීමකදීම සභාව විසින් අනුමත කරන ගෙවීම් වාර්තා හා ආදායම් ප්‍රගති වාර්තා වල එකතුවක් මෙසේ ඉදිරිපත් කරන බවත් , එම සංඛ්‍යා ලේඛන පිළිබඳ විශ්වාසයක් පවතින බවත් , එම එකතුව නිවැරදි නම් හා ඊට පරිභාහිරව මෙයට කිසිවක් ඇතුලත් වී නොමැතිනම් මෙම මූල්‍ය ප්‍රකාශය සභා සම්මත කිරීම සුදුසු බව ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ එයට සියයට සියයක්ම එකඟ වන බවත් , මාසිකව ඉදිරිපත් කරන ලද සත්‍ය ආදායම් වියදම් වාර්තා වල සාරාංශය මෙසේ අවසන් ගිණුමෙන් පිළියෙල කර ඇති බවත් , මෙම වාර්තා මාසිකව ද විගණනයට ඉදිරිපත් කර ඇති බවත් , අවුරුදු කිහිපයක සිට මූල්‍ය ප්‍රකාශය සඳහා සභා

අනුමැතිය ලබා ගෙන ඉදිරිපත් කරන ලෙස දැනුවත් කර ඇති බවත් , මෙහි විශ්වාසය අනිවාරයෙන්ම පවතින බවත් , ඊට පරිහාහිරව සභාවට තිබෙන වත්කම් වල ප්‍රකාශනයක් මෙහි ඇතුලත් වන බවත් ය.

<u>**තීරණ අංක 01**</u>

2022 වර්ෂයට අදාළව සකස් කරන ලද පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශය හා එයට අදාළ කාර්ය සාධන වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**02. වෙනත් කරුණු**

- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වය හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ටී.මෝහන්දාස් මැතිතුමිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමාහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **සභාපතිතුමාගේ ස්තූති කතාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උපසභාපතිතුමන් , ගරු විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තූති කතාව අවසන් කරන ලදී.

පෙ.ව.10.40 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.

ප්‍රාදේශීය සභා ....................................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ............................................................ ............................ මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2023-03-02 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව